සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

14 S I

දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 10 - 2019**

නම/විභාග අංකය :.................................... කතෝලික ධර්මය - I කාලය: පැය 01යි.

වැදගත් :
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමිවේ.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(1) ගැලවීමේ ඉතිහාසයේ පරමාර්ථය වන්නේ,
1. දේව විශ්වාසය වර්ධනය කිරීමයි.
2. රතු මුහුදෙන් එතෙරවීම පිළිබිඹු කිරීමයි.
3. ඓතිහාසික සිදුවීම් අනාවරණය කිරීමයි.
4. ඉශ්‍රායෙල් ජනතාවගේ අත්දැකීම ඉදිරිපත් කිරීමයි.

(2) සීනයි ගිවිසුම හෙවත් දස පණතට අනුව ජීවත් වන විට අපට ලැබෙනුයේ,
1. ගැලවුම් මාර්ගයයි.
2. දේව ආශිර්වාදයයි.
3. විශ්වාසයේ අත්දැකීමයි.
4. ගිවිසුමට පක්ෂපාතී වීමයි.

(3) දෙවියන් වහන්සේ ලෝකය මවා වදාළේ,
1. අභිරහස්මය ආකාරයෙනි.
2. තම පුතණුවන් විශ්වයට එවීමෙනි.
3. දේව වචනයේ බලයෙනි.
4. පරිණාමවාදයේ ප්‍රතිඵලය ලෙසිනි.

(4) ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආලෝකය තුල පෝෂණය වනුයේ,
1. ක්‍රිස්තුවේදීය සම්ප්‍රදායයි
2. ඉශ්‍රායෙල් සභාවේ සම්ප්‍රදායයි
3. දේව වේදීය ඉතිහාසයයි.
4. ජීවන සභා සම්ප්‍රදායයි.

(5) නව ගිවිසුමේ පොත් වර්ගීකරණය අනුව ලූක් සුභාරංචියේ දෙවන කාණ්ඩය වන්නේ,
1. එළිදරව් ග්‍රන්ථය යි.
2. ජොහාන් සුභාරංචිය යි.
3. හෙබ්‍රෙව් ග්‍රන්ථය යි.
4. ක්‍රියා පොත යි.

(6) ශුද්ධ වූ පාවුළු තුමා විසින් පෞද්ගලිකව කිතුනු බැතිමතෙකුට රචිත ලිපියක් වන්නේ,
1. තීතස් ය.
2. ජාකොබ් ය.
3. පිලමොන් ය.
4. තිමති ය.

(7) ඉශ්‍රායෙල් දිවැසිවරුන් ක්‍රමයෙන් අතුරුදහන් වන යුගයක බිහිවූයේ,
1. ප්‍රඥා සාහිත්‍යයයි.
2. එළිදරව් සාහිත්‍යයයි
3. පංච පුස්තකයයි.
4. දිවැසිවර ග්‍රන්ථයයි.

(8) සියලු නපුරු බලවේග විනාශ වී ඇදහිලිවන්තයින් උදෙසා සෞභාග්‍යමත් කාලයක් උදාවන බව පවසන්නේ,
1. යුගාන්ත වාදයෙනි.
2. ද්විත්ව වාදයෙනි.
3. සංකේත භාවිතයෙනි
4. රූපාන්තර පරිවර්තනයෙනි.

(9) ඩොමීෂියන් නම් රෝම අධිරාජ්‍යා යටතේ දරුණු පීඩන සමයකදී රචිත ග්‍රන්ථයකි.

1. එළිදරව්ව
2. දානියෙල්
3. ගීතාවලිය
4. හිතෝපදේශය.

(10) ගිබියොන්හි සමිඳාණන් වහන්සේ ස්වප්නයකින් දර්ශනය වූයේ,

1. සලමොන්ට ය.
2. ඊසාක්ට ය.
3. දාවිත්ට ය.
4. ආබ්‍රහම්ට ය.

(11) ''නුඹ මාගේ ආඥා ද, පණත් ද, රක්ෂා කරමින් මාගේ මාර්ගවල හැසිරෙන්නෙහි නම් නුඹේ ආයුෂ ද වැඩි කරන්නෙමි'' මෙසේ සඳහන් වන්නේ,

1. 1 රාජාවලියේ ය.
2. 1 වංශාවලියේ ය.
3. 2 සාමුවෙල්හි ය.
4. 2 මකබිවල ය.

(12) ''හොක්මා'' යන හෙබ්‍රෙව් වචනයේ අර්ථය වන්නේ,

1. ගැලවීමේ මාර්ගය ආසන්න බවයි.
2. සාර්ථකව හා ධර්මිෂ්ඨ ව ජීවත් වීමේ හැකියාවයි.
3. දෙවියන් වහන්සේගේ උත්කෘෂ්ඨභාවය ප්‍රකාශ කිරීමයි.
4. සැඟවී තිබූ යමක් ප්‍රකාශ වීමයි.

(13) ජෝබ් හා ධර්මදේශකයා ග්‍රන්ථවල ඇතුළත් ප්‍රඥාව වන්නේ ,

1. පවුල හා ගෝත්‍රික ප්‍රඥාවයි.
2. රාජ්‍ය සභා ප්‍රඥාවයි
3. අභිධාර්මික ප්‍රඥාවයි.
4. එදිනෙදා ජීවිතය පිළිබඳ ප්‍රඥාවයි.

(14) ප්‍රඥා සාහිත්‍යයේ ප්‍රධාන අරමුණ වූයේ,

1. ජීවිත හරය විශ්වය පිළිබඳ විග්‍රහයයි.
2. එදිනෙදා ජීවිතයේ මුහුණ දෙන අවස්ථාවලට උපදේශනයයි.
3. ඉශ්‍රායෙල් ජනතාව ගිවිසුමට පක්ෂපාතී වීමයි.
4. ධර්මිෂ්ඨව හා නිවැරදිව දෙවියන් වහන්සේට ප්‍රිය මනාපව දිවි ගෙවීමයි.

(15) ජේසුස් වහන්සේගෙන් ජුදා ශ්‍රේෂ්ඨාධිකරණයේ දී නැගූ ප්‍රධාන ප්‍රශ්නය වූයේ,

1. ''ඔබ ක්‍රිස්තුස් ද?'' යන්නයි.
2. ''ජේසු නසරේනු ජුදයින්ගේ රජු'' යන්නයි.
3. ''ඔබ කවරෙකු සොයන්නෙහු ද?'' යන්නයි.
4. ''ඔබ ජුදයින්ගේ රජු ද?'' යන්නයි.

(16) ආදම් ඒව ගේ පාපයෙන් පසු දෙවියන් වහන්සේ මානව සංහතියට දුන් පොරොන්දුව වූයේ,

1. අමරණීයත්වයයි.
2. ගැලවීමයි.
3. උත්ථානයයි.
4. එතෙරවීමයි.

(17) ජේසුස් වහන්සේ පාස්කු ඉරුදින සවස අපෝස්තුළුවරු වෙත වැඩම කර ප්‍රකාශ කළේ,

1. ''සකල ජාතීන් ගෝලයන් කරන්න'' යන්නයි.
2. ''මාගේ අණ පණත් රක්ෂා කරන්න උගන්වන්න'' යන්නයි.
3. ''ඔබට ශාන්තිය වේවා'' යන්නයි.
4. ''මා වදාළ සියල්ල ඔවුන්ට පවසන්න'' යන්නයි

(18) පාස්කුවෙන් පසු ජුදා ආගමිකයින්ගේ ප්‍රධාන මංගල්‍යය වූයේ,

1. නැඹුල් එළ මංගල්‍යය හෙවත් නික්මයාමයි.
2. පාස්කු මංගල්‍යය හෙවත් ඉරුදින ණය මංගල්‍යයයි.
3. පාස්කු මංගල්‍යය හෙවත් එතෙරවීම යි.
4. ''පණත'' යන අර්ථය ඇති පෙන්තකොස්තයයි.

(19) ශුද්ධ වූ මහා ජාකොබ් හෙවත් සන්තියාගේ මුනිතුමන්ගේ හිස ගසා දැමුවේ.

1. මහා හෙරෝද් විසින් ය.
2. හෙරෝද් ඇන්ටිපස් විසින් ය.
3. හෙරෝද් පිලිප් විසින් ය.
4. හෙරෝද් අග්‍රිපා විසින් ය.

(20) පහත කරුණු ඇසුරෙන් ශුද්ධ වූ පාවුලු තුමා ක්‍රිස්තු භක්තිකයන්ට පීඩා කළ කරුණු ඇතුළත් වරණය වන්නේ,

A. ජුදා ව්‍යවස්ථාව පිළිබඳ ගැඹුරු ඥානයක් තිබීම ය.
B. ස්තේපන් තුමාගේ මරණයේදී වික්ෂිප්ත වූ බව ය.
C. ජුදා දහමට ඇළුම් කිරීමත්, රැකගැනීමට උත්සහ කිරීමත් ය.
D. දමස්කයෙන් ලද අවසරය ය.

1. A හා B
2. B හා C
3. A හා C
4. B හා D

(21) ශුද්ධ වූ පේදුරු තුමාගේ මහා ප්‍රකාශය සිදු කළේ,

1. සිරියාවේ අන්තියෝකයේ ය.
2. පිසීදියේ අන්තියෝකියේ ය.
3. ග්‍රීසියේ ඇතැන්ස්හිදී ය
4. පිලිප්පි කයිසාරියේදී ය.

(22) අපෝස්තුළුවරුන්ගේ නායකයා වූ පේදුරු තුමාගේ තැනට අද පත්ව සිටින්නේ,

1. රදගුරුතුමා ය.
2. අගරදගුරුතුමා ය.
3. ශුද්ධෝත්තම පියතුමා ය.
4. අනුනායක පියතුමා ය.

(23) ශුද්ධ වූ සභාවේ අනිවාර්ය ලක්ෂණ ඇතුළත් යැදුම වන්නේ,

1. ස්වාමිවාක් ආරාධනාවයි.
2. විශ්වාස ලක්‍ෂණය යි.
3. ත්‍රිත්ව ස්තෝත්‍රයයි.
4. තුන් කාලයේ ආරාධනාවයි.

(24) ශුද්ධ වූ සභාවේ ලක්ෂණයකි.

1. ඉගැන්වීම
2. යාච්ඤාව
3. ශුද්ධත්වය
4. පූප කැඩීම

(25) ශුද්ධ වූ සභාව ශුද්ධවන්ත වන්නේ,

1. උත්ථාන වූ ස්වාමීන් වහන්සේ නිසා ය.
2. ශුද්ධ වූ ත්‍රීත්වයට ඇති සම්බන්ධතාවය මත ය.
3. එකම දේවත්වය පදනම් වන නිසා ය.
4. ශුද්ධ වූ සභාව විශ්වීය වන නිසා ය.

(26) ''අපෝස්තුළුවරයා'' යන්නෙන් අදහස් වන්නේ,

1. යවනු ලැබූ තැනැත්තා ය.
2. ආශිර්වාද ලද තැනැත්තා ය.
3. අභිෂේක කළ තැනැත්තා ය.
4. ආලේප කළ තැනැත්තා ය.

(27) ක්‍රි. ව. 1687 දී ලක්දිව කිතුනුවන් ලන්දේසි පීඩනයෙන් මුදවා ගැනීමට දෙවියන් වහන්සේ විසින් එවන ලද ගැලවුම්කරුවා වූයේ,

1. ශුද්ධ වූ ජුසේතුමා ය.
2. ගෞරවණීය ගොන්සාල්වේස් පියතුමා ය.
3. ශුද්ධ වූ මැක්ෂිමිලියන් මුනිතුමා ය.
4. ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමා ය.

(28) ගෞරවනීය ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා දේශීය කිතුණු සාහිත්‍යය ගොඩනැංවීමට කළ විශාල සේවාවන් වන්නේ,

1. ග්‍රන්ථකරණය / නාට්‍ය කලාව / සංගීතය
2. නාට්‍ය කලාව / චිත්‍ර කලාව / සංගීතය
3. ග්‍රන්ථකරණය / සංගීතය / නර්තනය
4. නාට්‍ය කලාව / සාහිත්‍යය / චිත්‍ර කලාව

(29) ශ්‍රී ලාංකික කතෝලික සභාව දේශීයකරණයට යොමු වූයේ,

1. පෘතුගීසි යුගයේ දී ය.
2. බ්‍රිතාන්‍ය යුගයේදී ය.
3. නිදහසින් පසු යුගයේ දී ය.
4. ලන්දේසි යුගයේ දී ය.

(30) අති උතුම් රායප්පු ජෝෂප් රදගුරු හිමිපාණන් සේවය කළ රදගුරු පදවිය වන්නේ,

1. යාපනය
2. මන්නාරම
3. මඩකලපුව
4. ත්‍රිකුණාමලය

(31) ක්‍රිස්තුන් වහන්සේ මෙලොවින් සමුගැනීමට පෙර මහ බ්‍රහස්පතින්දා දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපිත කළේ,

1. ''ස්තුති කොට කඩාදෙනු සඳහා ය''
2. ''මෙය ගෙන ඔබ අතරේ බෙදාගනු සඳහා ය.''
3. ''තුති පුදා සිහිකිරීම සඳහා ය.''
4. ''අප හා සමඟ සදහටම සිටිනු සඳහා ය''

(32) දිව්‍ය රහස් කරන මොහොතේ ලන්චියානෝ නුවර දේවස්ථානයේ සිදුවූයේ,

1. පූපය මස් වැදල්ලක් බවට පත්වීමයි.
2. ශ්‍රී රුධිරය පරීක්ෂණ සිදු කිරීමයි.
3. දිව්‍ය සත්ප්‍රසාදය කරඬුවක තැන්පත් කිරීමයි.
4. ශුද්ධ වූ ලෙගෝෂියන් මුනිතුමන්ට දේවස්ථානය කැප කිරීමයි.

(33) වර්තමානයේ පාස්කු යාගය නැවත සිහිගැන්වෙන අවස්ථාව වන්නේ,

1. ස්තෝත්‍ර යැදුමයි.
2. දිව්‍ය යාගයයි.
3. යාම යැදුමයි.
4. සත්ප්‍රසාද වන්දනාවයි.

(34) ශුද්ධ වූ ජුවාම් තුමාට අනුව දිව්‍ය පූජාවේ යථාර්ථය වන්නේ,

1. ඉරුදින ණය යුක්තිය ඉටු කිරීමයි.
2. දිව්‍ය පූජාවට භක්තියෙන් සහභාගී වීමයි.
3. ප්‍රේමය හා සේවය ක්‍රියාවට නැංවීමයි.
4. ප්‍රේමයෙන් තොරව කටුයතු කිරීමයි.

(35) දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට සහභාගී වීමට ශාරීරිකව සූදානම් විය යුත්තේ,

1. ජම්ම පාපයෙන් නිදොස් වීමෙනි.
2. යහපත් පාපොච්චාරණයක් කර ගැනීමෙනි.
3. පඬුර පුදසුන මත තබා සමගි වීමෙනි.
4. පැයක පමණ කාලයක සිට නිරාහාරව සිටීමෙනි.

(36) ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා රචිත, භාෂා හතළිකට පරිවර්තනය වූ ග්‍රන්ථය වන්නේ,

1. දේවවේද පුරාණය ය.
2. අධ්‍යාත්මික ගීතය ය.
3. ඇතුළාන්ත මන්දිරය ය.
4. බලාපොරොත්තුවේ එළිපත්ත ය.

(37) ක්‍රි. ව. 2001 දී ප්‍රථම වරට මුස්ලිම් පල්ලියකට වැඩම කළේ,

1. VI වන ජුවාම් පාවුළු පාප් තුමා ය.
2. ශුද්ධ වූ X වන පියුස් පාප් තුමා ය.
3. ශුද්ධ වූ දෙවන ජුවාම් පාප් තුමා ය.
4. XVI වන ප්‍රැන්සිස් පාප් තුමා ය.

(38) ශුද්ධ වූ මැක්ෂිමිලියන් කෝල්බේ පියතුමාව ජර්මන් නට්සිවාදීන් මරණයට පත් කළේ,

1. හිසගසා දැමීමෙන් ය.
2. විෂ ශරීරගත කිරීමෙන් ය.
3. ගල්වලින් ගැසීමෙන් ය.
4. සතුන්ට ආහාර පිණිස දීමෙන් ය.

(39) ''ජීවමාන සාන්තුවරිය'' ලෙස විරුදාවලිය හිමි, ශුද්ධ වූ තෙරේසා මව්තුමියගේ මුඛ්‍ය පරමාර්ථය වූයේ,

1. ආදරය අහිමි අයට ආදරය, රැකවරණය ලබා දීම ය.
2. ධර්මදානය ප්‍රගුණ කිරීම ය.
3. තම නිකාය ව්‍යාප්ත කිරීම ය.
4. නොබෙල් සාම ත්‍යාගය අරමුණ කරගැනීම ය.

(40) සෑම පාපයකටම හේතුව වන්නේ,

1. ආගම දහම ගැන හරි හැටි නොදැනීමයි.
2. දෙවියන් වහන්සේව නො දන්නා කමයි.
3. පාපොච්චාරණය කරගැනීමට නොහැකි වීමයි.
4. පාපයට පෙළඹීමට ඇති රුචිකත්වයයි.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 14 | S | II |
|---|---|---|

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

## Second Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය :....................................... කතෝලික ධර්මය - II කාලය: පැය 02යි.

වැදගත් :

✳ පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න හතරක් සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

✳ පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමිවේ.

(1) (i) ශුද්ධ බයිබලයේ දෙයාකාර කතෘත්වය සඳහන් කරන්න.

(ii) නව ගිවිසුමේ වර්ගීකරණයට අනුව හසුන්පත් අයත් ප්‍රධාන කාණ්ඩ දෙක නම් කරන්න.

(iii) ශුද්ධ බයිබලයේ සංකේත භාවිතයෙන් ලියා ඇති ග්‍රන්ථ දෙක නම් කරන්න.

(iv) පෙන්තකොස්ත දින දී ශුද්ධාත්මයාණන් වැඩම කළ බවට සලකුණු දෙකක් සඳහන් කරන්න.

(v) ශුද්ධ වූ පාවුළු තුමා සමඟ දෙවන ධර්මදූත චාරිකාවට සහභාගි වූවන් දෙදෙනෙකු නම් කරන්න.

(vi) පෘතුගීසි පාලන සමයට නතු වීමත් සමඟ මෙරටට පැමිණි ධර්මදූත කණ්ඩායම් දෙකක් නම් කරන්න.

(vii) දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම් දෙකක් සඳහන් කරන්න.

(viii) ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග දෙකක් නම් කරන්න.

(ix) ඉශ්‍රායෙලයේ දවන පූජා සඳහා යොදා ගන්නා සත්වයින් දෙදෙනෙක් නම් කරන්න.

(x) ශුද්ධ වූ මැක්ෂිමිලියන් කෝල්බේ මුනිතුමා දුටු දර්ශනයේ ඔටුනු දෙකෙහි අර්ථය සඳහන් කරන්න.

(2) (i) ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(ii) පුරාණ ගිවිසුම තුළ ප්‍රඥාව ඉදිරිපත් කර ඇති සාහිත්‍යමය ස්වරූප තුනක් ලියන්න.

(iii) ම්ලේච්ඡ ත්‍රස්තවාදී ප්‍රහාරය හමුවේ ඔබ ප්‍රඥාවන්තව කටයුතු කළ ආකාර පහක් සඳහන් කරන්න.

(3) (i) ජේසුස් වහන්සේ කුරුසියේ එල්ලී සිටියදී ජුදයින් විසින් ජේසුස් වහන්සේට දැක්වූ ප්‍රතිචාර දෙකක් සඳහන් කරන්න.

(ii) ජේසුස් වහන්සේ උකුත් වූ අවස්ථාවේ දී වූ සිදුවීම් තුනක් සඳහන් කරන්න.

(iii) ''කතෝලික අපගේ ජීවිත ජයග්‍රහණය කුරුසියේ ජයග්‍රහණයයි'' මෙම අභියෝගය පසක් කර ගනිමින් පුවත්පතකට ලිපියක් සකස් කරන්න.

(4) (i) ධර්මදූත චාරිකාවලදී ශුද්ධ වූ පාවුලු තුමාට මුහුණ දීමට සිදුවූ අභියෝග දෙකක් සඳහන් කරන්න.

(ii) ශුද්ධ වූ පාවුලු තුමා සංදේශ ලියා යැවීමට හේතු වූ කරුණු දෙකක් සඳහන් කරන්න.

(iii) බහු ආගමික පරිසරයක වෙසෙන කිතුණු විශ්වාසකයින්ට ශුද්ධ වූ පාවුලු තුමාගෙන් ලබා ගත හැකි ආදර්ශ පහක් සඳහන් කරන්න.

(5) (i) ජේසුස් වහන්සේ සීමොන්ට දෙන ලද නාමය සඳහන් කර, එහි අර්ථය සඳහන් කරන්න.

(ii) ජේසුස් වහන්සේ පේදුරු තුමාට පැවරූ තුන් ප්‍රකාර කාර්යය සඳහන් කරන්න.

(iii) ශුද්ධ වූ පේදුරුතුමාගේ නායකත්වයේ ලක්ෂණ විදහා දක්වමින් කිතුණු සිසුවකු ලෙස පාසල තුළ ඔබ ක්‍රියා කරන ආකාර පහක් සඳහන් කරන්න.

(6) (i) ''මාංශය'' හා ''රුධිරය'' ලෙස අදහස් කරන්නේ කුමක්දැයි සඳහන් කරන්න.

(ii) දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට පංගුකාර වන්නේ කෙසේදැයි කරුණු තුනක් මගින් සඳහන් කරන්න.

(iii) අප දිව්‍ය සත්ප්‍රසාදය වෙත ගෞරවයෙන් සම්බන්ධ විය හැකි අවස්ථා පහක් සඳහන් කරන්න.

(7) පහත සඳහන් මාතෘකා දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) පාස්කු අභිරහස

(ii) පේදුරු තුමාගේ මහා ප්‍රකාශය

(iii) ඒකත්වය

(iv) කතෝලිකත්වය

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

14 | S | I II

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 10 - 2019

## කතෝලික ධර්මය - පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1 | 1 | 11 | 1 | 21 | 4 | 31 | 4 |
| 2 | 2 | 12 | 2 | 22 | 3 | 32 | 1 |
| 3 | 3 | 13 | 3 | 23 | 2 | 33 | 2 |
| 4 | 4 | 14 | 4 | 24 | 3 | 34 | 3 |
| 5 | 4 | 15 | 1 | 25 | 2 | 35 | 4 |
| 6 | 3 | 16 | 2 | 26 | 1 | 36 | 4 |
| 7 | 2 | 17 | 3 | 27 | 4 | 37 | 3 |
| 8 | 1 | 18 | 4 | 28 | 1 | 38 | 2 |
| 9 | 1 | 19 | 4 | 29 | 3 | 39 | 1 |
| 10 | 1 | 20 | 3 | 30 | 2 | 40 | 2 |

## II පත්‍රය

(1) (i) ප්‍රධාන කර්තෘ - දෙවියන් වහන්සේ
උපකාරක කර්තෘ - මිනිසා (පිටුව 01)

(ii) ශුද්ධ වූ පාවුලු තුමාගේ ලිපි / වෙනත් ලිපි (පිටුව 04)

(iii) පුරාණ ගිවිසුමෙහි දානියෙල් පොත / නව ගිවිසුමෙහි එළිදරව්ව පොත (පිටුව 10)

(iv) සැඩ සුළඟක් හමන්නාක් වැනි හඬක් හදිස්සියේ පැමිණීම. ගිනි දලු වැනි දිව් බෙදී ගොස් ඔවුන් එකිනෙකා මත පිහිටීම (පිටුව 23)

(v) සීලස් / තිමෝතියස් / ලූක් (පිටුව 28)

(vi) ජේසු නිකායික ධර්මදූතවරු / දොමිනිකාන නිකායික ධර්මදූතවරු / අගුස්තීනු නිකායික ධර්මදූතවරු / (පිටුව 28)

(vii) පූප කැඩීම / ස්වාමීන් වහන්සේගේ රාත්‍රී භෝජනය / නව පාස්කු මංගල්‍යය / ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයේ සහභාගිකම (පිටුව 46)

(viii) පාස්කු බැටළුවා / නුහුහුන් රොටී / තිත් පලා / මිදියුෂ (පිටුව 50)

(ix) ගවයින් / බැටළුවන් / එළුවන් / කුරුල්ලන් (කොබෙයියන් හා පරෙවියන්) (පිටුව 55)

(x) සුදු රෝස ඔටුන්න - ව්‍රත ශුද්ධිය
රතු රෝස ඔටුන්න - ප්‍රාණ පරිත්‍යාගී ජීවිතය (පිටුව 60)

(2) (i) ජෝබ් / ගීතාවලිය / හිතෝපදේශකයා / ධර්මදේශකයා / ප්‍රේම ගී / ප්‍රඥාව / සිරාක් හෙවත් උපදේශකයා (පිටුව 17)

(ii)
* ප්‍රස්ථාව පිරුළු (හිතෝපදේශය)
* උපදේශ (උපදේශකයා හෙවත් සිරාක්)
* කථාන්දර (ජෝබ්)
* සංකල්පනා (ධර්ම දේශකයා)
* ගීත (ප්‍රේම ගී) (පිටුව 17)

(iii)
* අනතුර සිදු වූ ස්ථානයට යාමෙන් වැළකී සිටීම
* ලේ දන් දීමේ ව්‍යාපෘතියක් ඇත්නම් ඒ සඳහා දායක වීමට උත්සාහ කිරීම
* මෙවැනි ත්‍රස්තවාදී ක්‍රියාවන් නැවත ඇති නොවීමට ප්‍රාර්ථනා කිරීම හා ඒ වෙනුවෙන් යාච්ඤා කිරීම.
* රටේ සාමය පතා නිරන්තර යාච්ඤාවට යොමු වීම.

* විවිධ කටකතා පැතිරවීමෙන් වැළකී සිටීම
* තමා සිටින ස්ථානය හෝ යන ස්ථානවල පුද්ගලයින් පිළිබඳව සුපරීක්ෂාකාරීව කටයුතු කිරීම.
* සතුරු වේශයෙන් පැමිණි ත්‍රස්තයන් කෙරෙහි මෙත් සිත් වැඩීම.
* කාදිනල් හිමිපාණන්ගේ ප්‍රකාශවලට අවනත වී කටයුතු කිරීම.

(වැනි පිළිතුරු සඳහා ලකුණු පිරිනැමීමට කටයුතු කරන්න)

(3) (i) සරදම් කිරීම / කාඩි පිළිගැන්වීම / වස්ත්‍ර බෙදා ගැනීමට දාදු දැමීම /''ජේසු නසරේනු ජුදයින්ගේ රජ'' යනුවෙන් ලියූ පුවරුව කුරුසයට ඉහළින් තැබීම. (පිටුව 20)

(ii)
* හිරු අඳුරු වීම.
* රට පුරා අන්ධකාරයක් පහල වීම.
* දේව මාළිගාවේ තිරය දෙකඩ වී ඉරී යාම. (පිටුව 21)

(iii)
* ක්‍රිස්තු උත්ථානය විජයග්‍රාහීව විශ්වාස කරන කිතුණු අප සැම අපගේ විශ්වාසය දැඩි කරගෙන කටයුතු කිරීම අගනේ ය.
* දෙවියන් වහන්සේ සමඟ අනන්ත ජීවිතය කරා යොමු වන මග උත්ථානය බව අදහා ගැනීම
* ජීවිතයේ කුරුසයන් දරා ගෙන ක්‍රිස්තුන් වහන්සේ පසුපස ගමන් කිරීමට වෑයම් කිරීම
* කුරුසයේ මාර්ගය කිතුණුවාට වරප්‍රසාදීය දිවියක් බව (සිසුන් ලියා ඇති පිළිතුරු අනුව ලකුණු දෙන්න.)

(4) (i) සිරකරනු ලැබීම / ගල් ගසා නගරයෙන් පිටතට ඇද දැමීම / ජුදයින්ගේ විරෝධයට ලක්වීම (පිටුව 27)

(ii)
* ශුද්ධ වූ පාවුලු තුමා ස්ථාපිත කළ සභාවන්හි ගැටළු නිරාකරණය කිරීමට
* කිතුණු ඇදහිල්ල හා යුතුකම් පෙන්වා දීමට
* ක්‍රිස්තුන් වහන්සේ තුළ නව ජීවනය පවත්වා ගැනීමට
* ක්‍රිස්තුන් වහන්සේගේ පුනරාගමනය පිළිබඳ ගැටළුවලට පිළිතුරු දීමට (පිටුව 27)

(iii)
* අභියෝග තුළ නොසැලී ඉදිරියට යාම.
* හැකි උපරිමයෙන් සේවය සඳහා කැපවීම
* දෙවිඳුන් කෙරෙහි අචල විශ්වාසයකින් කටයුතු කිරීම
* උත්ථාන වූ ස්වාමීන් වහන්සේව ජීවමානව අත්දුටු කෙනෙකි.
* එම නිසා උත්ථාන වූ ස්වාමීන් වහන්සේව ප්‍රබලතව අන් අයට හඳුන්වා දීමට කටයුතු කළ කෙනෙකි.

(වැනි කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න)

(5) (i) නාමය - පේදුරු
අර්ථය - පර්වතය (පිටුව 31)

(ii) මාගේ බැටළු පැටවුන් පෝෂණය කරන්න.
මාගේ බැටළුවන්ගේ එඬේරා වන්න.
මාගේ බැටළුවන් පෝෂණය කරන්න (පිටුව 31)

(iii) සිසුන් ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (පිටුව 45)

(6) (i) සක්‍රමේන්තු ආකාරයෙන් අපට ලැබෙන දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයකි (පිටුව 45)

(ii)
* ක්‍රිස්තුන් වහන්සේ ද සදහට ම ඔවුන් තුළ ජීවත් වන බව
* එකම ක්‍රිස්තුන් වහන්සේව බෙදා ගනු ලැබීම
* එම නිසා සියළු දෙනාම එකම ශරීරයක් වන බව
* එකම ශරීරය ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය බව (පිටුව 45)

(iii)
* දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමෙන්
* දිව්‍ය සත්ප්‍රසාද වහන්සේව වැඩම කර ඇති අවස්ථාවලදි දෙදණ නවා නමස්කාර කිරීම හා යාච්ඤා කිරීම.
* දේවස්ථානයේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේව තැම්පත් කර ඇති විට දණ නමස්කාර කර යාච්ඤා කිරීම.

(වැනි කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න)

(7) කෙටි සටහන්

(i) පිටු අංකය 19 / 20
(ii) පිටු අංකය 30 / 31
(iii) පිටු අංකය 34
(iv) පිටු අංකය 35